# <u>ප්‍රවෘත්ති නිවේදනයයි</u>

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම හා ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයේ වාර්ෂික මහ සභා රැස්වීම පසුගිය අගෝස්තු 10 වැනි දා ශ්‍රී ලංකා පුවත්පත් ආයතන මූලස්ථානයේ දී පැවැත්විණි.

ශ්‍රී ලංකා පුවත්පත් සංගමය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය ඒකාබද්ධව කළමනාකරණය කරන මෙම ආයතන ත්‍රිත්වයේ වාර්ෂික වාර්තා හා විගණන වාර්තා එහිදී සම්මත විය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ආරවුල් කිරාකරණ මණ්ඩලයේ සභාපති සැම් විජේසිංහ මහතා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වාර්තාවේ දක්වා ඇත්තේ ජනමාධ්‍ය "පිළිතුරු දීමේ අයිතිය" පිළිබඳ වැඩි අවධානයක් යොමුකර ඇති බවයි. එය සමාජ වගකීම් සහිත ජනමාධ්‍යක් ගොඩ නැගීමේ දී පුවත්පත් අංශයෙන් සිදු වූ වර්ධනයක් බව ඒ මහතා පවසයි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපති කුමාර් නඩේසන් මහතාගේ පෙරවදනේ දක්වෙන්නේ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම දැනටමත් ප්‍රකාශකයින් කර්තෘවරුන් හා මාධ්‍යවේදීන්ගේ පිළිගැනීම දිනාගෙන ඇති බවයි. ඒ සියලු දෙනා කොමිසමේ ඉල්ලීම්වලට අනුකූලතාව දක්වන බව හෙතෙම හඳුන්වා දෙයි. "ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් එළඹෙන තීන්දු ප්‍රකාශයට පත් කිරීමේ ස්ථාවර වර්ධනයක් අද පුවත්පත්වල දක්නට ලැබේ. ඒ හැර පීඩාවට පත් පාඨකයින් වෙනුවෙන් කතුවරුන් ස්වේච්ඡාවෙන්ම පිළිතුරු දීමේ අයිතිය ලබා දීම ඉහළ ගොස් තිබේ. එමෙන්ම ක්ෂේත්‍රයේ සිටින ජනමාධ්‍යවේදීන් මෙන්ම ජනමාධ්‍යට පිවිසෙන නවකයින් ද කර්තෘවරුන්ගේ වෘත්තීය ආචාර ධර්ම මාලාවට එක්වෙමින් සිටිති."

පැමිණිලි විසඳීම පිණිස සහය දීම පිළිබඳව ආරවුල් නිරාකරණ මණ්ඩලයට ස්තුති කළ හෙතෙම ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සාර්ථකත්වයට සහය දුන් කර්තෘවරුන්, ප්‍රකාශකයින් හා මහජනතාවට ද ස්තුතිය පළ කළේ ය.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය පිළිබඳව සඳහන් කළ නඩේසන් මහතා එය 1998 කොළඹ ප්‍රකාශනය හරහා බිහිවූ බව සඳහන් කළේ ය. පුවත්පත් සඳහා ස්වයංනියාමන යාන්ත්‍රණයක් ලෙස ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ද වෘත්තීය ජනමාධ්‍යවේදීන් හා ජනමාධ්‍යට පිවිසෙන නවකයින් උදෙසා පුහුණුවීම් ලබා දීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය ද ඒ සමග ආරම්භ විය.

" ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, මාධ්‍ය සම්බන්ධයෙන් රටේ ප්‍රමුඛතම ආයතනය බවට පත්ව සිටී. අප රටේ අනාගත ජනමාධ්‍යන් හී පැවැත්ම සනාත කිරීම පිණිස කර්තෘවරුන්ට ප්‍රකාශකයින්ට හා ජනමාධ්‍යවේදීන්ට එක් වී ක්‍රියා කිරීමට ඉඩ සලසා දී ඇත."

ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය පුවත්පත් රූපවාහිනී හා ගුවන්විදුලි අංශ යටතේ ශිෂ්‍යයින් 75 දෙනෙකුට පමණ ඩිප්ලොමා පාඨමාලාවක් පවත්වාගෙන යන බවත් මාණ්ඩලික ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් වෘත්තීය පුහුණු පාඨමාලා හා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙනුවෙන් වැඩමුළු පවත්වන බවත් හෙතෙම සඳහන් කළේ ය.

මෙම ආයතන තුනට අද පවතින මට්ටමට ළඟා වීමට සහය දුන් ඒවායේ කාර්ය මණ්ඩලවලට, කර්තෘවරුන්ට, ප්‍රකාශකයින්ට, සියලු අනුග්‍රාහකයින්ට, ආධාරක ප්‍රජාවට හා නන් අයුරින් සහය දුන් සැමටත් නඩේසන් මහතා ස්තුතිය පළ කළේ ය.

අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිවරුන් සහ කෝපරේට් සර්විසස් පුද්ගලික සමාගම යන ආයතන තුනේ ගණකාධිවරුන් සහ ලේකම්වරු යළිත් තෝරා පත් කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය

කුමාර් නඩේසන් මහතා, රංජිත් විජේවර්ධන මහතා, සිංහ රත්නතුංග මහතා, මණික් ද සිල්වා මහතා, මොහාන් ලාල් පියදාස මහතා, වරුණ කරුණාතිලක මහතා, ශාමිනී බොයිල් මහත්මිය, සීතා රංජනී මෙනෙවිය සහ පෝද්දල ජයන්ත මහතා.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලය

කුමාර් නඩේසන් මහතා, නිමල් වෙල්ගම මහතා, මණික් ද සිල්වා මහතා, සිංහ රත්නතුංග මහතා, සුනිල් ජයසේකර මහතා, එන්. එම්. අමීන් මහතා, සුන්දර නිහතමානී ද මැල් මහතා සහ නිස්තාර් කාසිම් මහතා

ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය

රංජිත් විජේවර්ධන මහතා, මණික් ද සිල්වා මහතා, සිංහ රත්නතුංග මහතා, ප්‍රභාත් සහබන්ධු මහතා, වරුණ කරුණාතිලක මහතා සහ කංචන මාරසිංහ මහතා

---------------------------------------------------------------------------------------------